# උසාවි දඩ මුදල් සහ ඉඩම් පැවරීම මත අයවන මුද්දර ගාස්තු පළාත් පාලන ආයතන වෙත ලැබීම විධිමත් කිරීම හා කඩිනම් කිරීමේ අවශ්‍යතාවය

පළාත් පාලන ආයතනවල ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස සැලකෙන මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් පළාත් පාලන ආයතනවලට ලැබීම ඉතාමත් දුර්වල තත්වයක පවතින බව පළාත් සභා ආරම්භ යේ සිටම පළාත් පාලන ආයතන විසින් නගන චෝදනාවකි. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පළාත් සභා හදුන්වා දීමත් සමගම මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් පළාත් සභා ලැයිස්තුවේ ඇති විෂයයක් ලෙස හදුන්වා දීම හේතුවෙන් මහා නගර සභා ආඥා පනත , නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා පනත ඔස්සේ පළාත් පාලන ආයතන වෙත හිමිවිය යුතු මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් ඒවාට ලබාදීම සඳහා දීර්ඝ පටිපාටියක් අනුගමනය කිරීමට සිදුවී ඇත.

1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 19 වන වගන්තිය මගින් පළාත් සභා වල සියළු ලැබීම් එම සභාවෙහි අරමුදලට බැරවිය යුතු බවට වන ප්‍රතිපාදනය හේතුවෙන් අදාල මුද්දර ගාස්තු ඉඩම් රෙජිස්ටාර් කාර්යාලය විසින් පළාත් සභා අරමුදල වෙත බැර කරීමටත් ඉන් අනතුරුව ප්‍රධාන පනත් තුනෙහි ප්‍රතිපාදන පරිදි පළාත් සභා විසින් එකී මුදල් නැවත පළාත් පාලන ආයතනයට ලබාදීමටත් සිදුවන තත්ත්වයක් උද්ගතවී ඇත.

ඉහතකී ප්‍රතිපාදන හේතුවෙන් මෙම ආදායම සෘජුවම පළාත් පාලන ආයතනවලට ලබාදීම සඳහා නෛතිකමය බාධාවක් ඇතිවී ඇති අතර ඒ හේතුවෙන් පළාත් සභා අරමුදලේ වන මුදල් එලෙස පළාත් පාලන ආයතන වෙත ලබාදීම සම්බන්ධයෙන් ක්‍රමවේද විධිමත් කිරීම සඳහා පළාත් සභා ප්‍රඥප්තීන් සම්මත කර ගෙන ඇත. මෙකී ඇතැම් ප්‍රඥප්තීන් තුල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා පටහැනි ප්‍රතිපාදන ද අන්තර්ගතවී ඇති බව දක්නට ලැබෙන අතර ඇතැම් පළාත් පාලන ආයතන චෝදනා කරන පරිදි එවැනි ප්‍රඥප්තීන්වල අන්තර්ගත කාලාවරෝධී ප්‍රතිපාදන හේතුවෙන් මෙම මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් පළාත් පාලන ආයතන වෙත අහිමිවී යන තත්ත්වයක් ද පැන නැගී ඇත.

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අධ්‍යයනය කිරීමේ දී එහි 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුව තුළ 4 වන ඡේදය මඟින් පළාත් පාලන ආයතනවල සංයුතිය, ස්වරූපය සහ ව්‍යුහය නීතියෙන් නියම කළ යුතුය යන ව්‍යතිරේඛයට යටත්ව නීතියෙන් පිහිටුවන ලද පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පළාත් සභා වෙත පවරා ඇති බව පෙනේ. තවද එහි 36(6) වන ඡේදය සහ 36(8) වන ඡේදය මඟින් පිළිවෙලින් ඉඩම් සහ මෝටර් රථ වැනි දේපළ පැවරීම සම්බන්ධයෙන් මුද්දර ගාස්තු සහ අධිකරණය විසින් පනවනු ලබන දඩ පළාත් සභා සතු විෂයයන් වන බවට ප්‍රතිපාදන සලසා ඇත.

කෙසේ වෙතත් පළාත් පාලන ආයතන සංස්ථාපනය සහ ඒවායේ බලතල කාර්ය සහ කර්තව්‍ය පිළිබඳ විධිවිධාන අන්තර්ගත වන මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා පනත යන අන පනත්හි සඳහන් ප්‍රතිලාදන පරිදි ඉඩම් පැවරීම මත හිමිවන මුද්දර ගාස්තු මෙන්ම යම් යම් අණ පනත් ඔස්සේ ගනු ලබන නීතිමය ක්‍රියාමාර්ග හේතුවෙන් උත්පාදනය වන උසාවි දඩ මුදල් පළාත් පාලන ආයතන සතු විය යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ 4(3) ඡේදය පරිදි "පවත්නා නීතිය යටතේ ප්‍රාදේශීය සභා වලට පැවරී ඇති බලතල ප්‍රාදේශීය සභා වලට තිබෙන්නේය. පළාත් සභාවන් විසින් පළාත් පාලන ආයතන වෙත අතිරේක බලතල  පවරා දීම කළ හැක්කේය. එහෙත් එකී සභාවල බලතල අහිමි කිරීම පළාත් සභාවක් විසින් කල නොහැක්කේය". මෙකී ප්‍රතිපාදන සියුම්ව විග්‍රහ කර බැලීමේදී සිය බල ප්‍රදේශය තුළ මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් පිළිබඳව පළාත් පාලන ආයතනයක් වෙත හිමි වී ඇති බලතල පළාත් සභාවක් විසින් අහිමි කිරීම කෙතෙක් දුරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ එකඟ වන්නේද යන ගැටළුව පැන නගී.



දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය 21

4 : 3 පවත්නා නීතිය යටතේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති බලතල ඒ ආයතනවලට තිබෙන්නේ ය. මහා නගර සභා ආඥාපනත සහ නගර සභා ආඥාපනත යටතේ මහා නගර සභාවලට සහ නගර සභාවලට පැවරී ඇති බලතල ඒ ආයතනවලට තිබෙන්නේ ය. පවත්නා නීතිය යටතේ ප්‍රාදේශීය සභාවලට, පැවරී ඇති බලතල ප්‍රාදේශීය සභාවලට තිබෙන්නේ ය. පළාත් සභාවක් විසින් පළාත් පාලන ආයතන වෙත අතිරේක බලතල පවරා දීම කළ හැක්කේය. එහෙත් එකී සභාවල බලතල අහිමි කිරීම පළාත් සභාවක් විසින් කළ නොහැක්කේය;

පළාත් පාලන ආයතන වල පරිපාලනය අධීක්ෂණය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත් සභාවලට පැවරී ඇති වගකීම හේතු කොට ගෙන පළාත් පාලන ආයතනවල මුද්දර ආදායම් වැඩි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමේ වගකීමද, උසාවි දඩ මුදල් නිසියාකාරව පළාත් පාලන ආයතන වෙත ලබාදීමේ වගකීමද පළාත් සභා වෙත පැවරෙන බැවින් මෙම මුදල් සෘජුවම පළාත් පාලන ආයතනවල අරමුදලට බැරවීම හේතුකොට ගෙන ප්‍රඥප්තීන් මඟින් ඊට අදාල ක්‍රමවේද විධිමත් කිරීම පිළිබඳව ගැටළුවක් පැන නගින්නේ නැත. කෙසේ වෙතත් එවන් ප්‍රඥප්තියක් මගින්ම පළාත් පාලන ආයතනවල මුද්දර ආදායම හෝ උසාවි දඩ මුදල් මඟින් හිමිවන ආදායම අහිමි කිරීමට හෝ අඩු කිරීමට උත්සාහ කරන්නේ නම් එය මුද්දර ආදායම හා උසාවි දඩ මුදල් පිළිබඳව පළාත් පාලන ආයතන සතු බලතල අහිමි කිරීමට දරණ උත්සාහයක් වනු ඇත. වෙනත් ලෙසකින් කිවහොත් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උප ලේඛනයේ 4(3) ඡේදය සමඟ ඝට්ටනයක් ඇති වන අවස්ථාවක් වනු ඇත.

මෙම තත්ත්වය අදටත් මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් පිළිබඳව පළාත් පාලන ආයතන අත්විඳින ප්‍රායෝගික තත්ත්වය බවට  සාක්ෂි සහිතව කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත. මෙලෙස පළාත් පාලන ආයතන වෙත හිමි විය යුතු ආදායම් පළාත් සභා හරහා පළාත් පාලන ආයතන වෙත ලබාදිම උදෙසා ක්‍රියාත්මක කළ යුතු සංකීර්ණ ක්‍රියාවලිය හේතුකොට ගෙන අදාළ ආදායම් පළාත් පාලන ආයතන වෙත ලබාදීමේදී නිලධාරීන් වැඩි පිරිසකගේ දායකත්වය ඒ සඳහා ලබා ගැනීමට සිදුවන අතර අමතර පිරිවැයක් හා කාලයක්ද වැයකිරීමට සිදු වී ඇත. මෙවැනි කරුණු පිළිබඳව දිගින් දිගටම පළාත් පාලන ආයතන විසින් කරන ලද කරුණු දැක්වීම් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව පළාත් සභා පනතට ගෙන එන සංශෝධනයක් තුළින් මෙම ක්‍රියාවලිය සරල කිරීමේ හැකියාව පවතින බව පෙනී ගොස් ඇති බැවින් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් ඒ සඳහා අවශ්‍ය සංශෝධන යෝජනාවලියක් සකස් කර නීති කෙටුම්පත් සම්පාදකගේ සහ නීතිපතිගේ දායකත්වය සහිතව පනත් කෙටුම්පත්කරණ කටයුතු මේ වන විට අවසන් කර ඇත.


ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
ජනරජයේ ගැසට් පත්‍රය

2019 මැයි මස 17 වන දින

II වන කොටස

අතිරේකය

(2019.05.17 දින නිකුත් කරන ලදී)

පළාත් සභා (සංශෝධන)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය පරිදි එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට පෙර අතිගරු ජනාධිපතිතුමා විසින් පළාත් සභාවල අදහස් විමසීම සඳහා යොමු කළ යුතු අතර ඒ අනුව එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ ව්‍යවස්ථාව පරිදි පළාත් සභාවල අදහස් ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවිධ පාර්ශවයන් විවිධ මත පළ කරන බව දැනගන්නට. ලැබී ඇති අතර ඇතැමුන්ගේ මතය වන්නේ මෙතුළින් පළාත් සභාවල ආදායම කෙරේ යම් බලපෑමක් ඇති කළ හැකි බැවින් ඊට පළාත් සභාවල එකඟතාවය ලබා ගැනීමට නොහැකිවේය යන්නය. මේ වන විටත් දැනට විසුරුවා හැරීමකට ලක්වී නොමැති එකම පළාත් සභාව වන ඌව පළාත් සභාව මෙම පනත් කෙටුම්පතට විරුද්ධව යෝජනාවක් සම්මත කර ගෙන ඇති බව දැනගන්නට ඇත.



තවත් පිරිසක් මෙමඟින් ඉදිරියේදී මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් පිළිබඳව නිවැරදි නියාමනයක් නොමැතිවීම හේතුකොට ගෙන පළාත් පාලන ආයතන විසින් උත්පාදනය කළ හැකි ආදායම අඩු කිරීමට මඟ පෑදිය හැකි බව පෙන්වා දෙයි. කෙසේ වෙතත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ 4 වන ඡේදය මගින් මෙම ලිපියේ ඉහත ද පෙන්නුම් කළ පිරිදි පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂනය කිරීම සඳහා පළාත් සභා වලට පැවරී ඇති වගකීම හේතු කොට ගෙන මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් එකතු කිරීම සම්බන්ධව පළාත් ආදායම් කොමසාරිස්වරුන්ගේ දායකත්වය මත සැකසී ඇති යාන්ත්‍රනය තව දුරටත් එලෙසම ක්‍රියාත්මක කිරීමට පළාත් සභාවලට සිදුවන බව නිරීක්ෂනය කළ හැක. අදාල නියාමනය සම්බන්ධයෙන් පළාත් සභාව සතු වගකීමෙන් නිදහස් වීමට මෙම පනත් කෙටුම්පත හේතුවක් නොවනු ඇත.

පළාත් පාලන ආයතන විසින් දිගින් දිගමට මැසිවිලි නඟන මෙම කරුණ වරින් වර පාර්ලිමේන්තුවේ ද සාකච්ඡාවට භාජනය වී ඇති බැවින් පළාත් සභාවල එකඟතාවය නොලැබුනහොත් එය නීතියක් බවට පත්වීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවථාවේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය වන පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරය ලබා ගැනීමේ අපහසුවක් ඇති විය හැකි බවද නිරීක්ෂණය කළ නොහැක. මන්ද මෙය පොදුවේ පළාත් පාලන ආයතන වල ආදායම කෙරෙහි ඍජුවම බලපාන කරුණක් වන

බැවින්ද වෙනත් ලෙසකින් ගතහොත් එය ප්‍රාදේශීය ආණ්ඩුකරණය ශක්තිමත් කිරීම සඳහා වන බාධාවන් මැඩලීම සඳහා ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පතක් ද වන බැවිනි.

ඉහත කරුණු සැලකිල්ලට ගැනීමේ දී එම පනත් කෙටුම්පත සඳහා පාර්ලිමේන්තුවේ බහුතරයේ එකගතාවය ලැබෙනු ඇති බව අනුමාන කළ හැකිය. අනෙක් අතට පළාත් සභාවන් විසින් මේ පිළිබඳව සිදුකරන ලද සාකච්ඡාවලදී දිගින් දිගටම පවසා ඇත්තේ පවතින නීතිමය බාධාවන් නොවන්නට මෙම ආදායම හැකි ඉක්මනින් පළාත් පාලන ආයතන වෙත ලබාදීමේ අවශ්‍යතාවය තමන් වෙත පවතින බවකි. එසේ නම් සිය පළාත තුල පළාත් පාලන ආයතනවල අභිවෘද්ධිය උදෙසා ගෙන එනු ලබන මෙම පනත් කෙටුම්පතට විරුද්ධවීමේ සදාචාරාත්මක අයිතියක් පළාත් සභා වෙත පවතින බවද නොපෙනේ. එබැවින් පළාත් සභා ඡන්දය පවත්වා පළාත් සභාවන් ස්ථාපිත කළ වහාම පළාත් සභාවෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි මෙම පනත් කෙටුම්පත පිළිබඳව ශුභවාදී බලාපොරොත්තුවක් තබා ගැනීමේ බාධාවක් නොපවතින බව ද කිව මනාය.

**ගයනි ප්‍රේමතිලක**
*නීති නිලධාරී*
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය